# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1918/15 - 2015 ජුනි මස 10 වැනි බදාදා - 2015.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන පොම්පාගාරය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, අත්කර ගැනීමට යෝජිත මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන
හා ජලාපවහන අමාත්‍ය.

2015 ජුනි මස 04 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1125

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර හා ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුල්ගම්පොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වෙල් අට ගමේ පිහිටි බෝගහයටපැල නැමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 13.85 ක් පමණ වන (අංක. 1771A සැලැස්මේ කැබලි අංක.6) පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුර - නැගෙනහිර* | : | මෙම සැලැස්මේ කැබලි අංක. 4 (වලව්වෙවත්ත නොහොත් බෝගහපැලැස්ස සහ බෝමලුවකුඹුර) හා මෙම සැලැස්මේ කැබලි අංක 7 ; |
| *දකුණ - නැගෙනහිර* | : | බලයලත් මිනින්දෝරු ජේ. සී. ජොන්ක්ලස් මහතා විසින් පිළියෙල කරන ලද පිඹුරු අංක 2938හි අංක 7C හි කොටසක් ; |
| *දකුණ - බටහිර* | : | අංක මහ. 3859 මූලික පිඹුරේ අංක 14 හා 15 ; |
| *උතුර - බටහිර* | : | මෙම සැලැස්මේ කැබලි අංක 5 හා 3. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. මහින්ද කටුගහ මහතා,
අංක 39/4 - 13/3, රජපිහිල්ල මාවත,
කටුගස්තොට,
මහනුවර.

06 - 694

1A - G 21660 — 12 (2015/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*